#mediaethicsSL #SinhalaPress #lka #Resa #Lankadeepa
යම් කිසි ප්‍රවෘත්තියක් වාර්තා කිරීමේදී එහි නිරවද්‍යතාවය සනාථ කරගැනීම සහ ආරක්ෂා කිරීම සඳහා සාධාරණ උත්සාහයක් ගත යුතු බව අමුතුවෙන් කිව යුතු නොවේ. එය මාධ්‍යවේදියෙකු විසින් ආරක්ෂා කළ යුතු මූලික මාධ්‍ය ආචාර ධර්මයකි. මේ සඳහා මූලාශ්‍රයන් භාවිතා කිරීම, මූලාශ්‍රයන් එකකට වැඩි ප්‍රමාණයක් භාවිතා කිරීම ඔස්සේ කරුණු වල සත්‍යතාවය තහවුරු කර ගැනීම මෙන්ම තහවුරු නොවූ කරුණු කිසිසේත්ම පළ නොකිරීම වැනි භාවිතාවන් ඇති කර ගැනීම මනායි.

පසුගිය දිනක ලංකාදීප පුවත්පතේ 'සහරාන් කල්ලි පස්දෙනාගේ බැංකු ගිණුම් වල කෝටි 100ක්' යන මැයෙන් සැකකරුවන්ගේ නම්ද සඳහන් කරමින් පළවූ ලිපිය මෙහිදී උදාහරණයකට ගත හැක. මෙහිදී මූලාශ්‍ර ලෙසින් 'උසස් පොලිස් නිලධාරියෙකු' දක්වා තිබිණි.

කෙසේ නමුත් ඉන් පසුව රැස පුවත්පත මගින් හෙළිදරවු කිරීමක් සිදුකරමින් ලංකාදීප ප්‍රවෘත්තියේ විශ්වාසනීයත්වය ප්‍රශ්න කොට තිබිණි. එහිදී රැස පුවත්පත මගින් නිවැරදිව එකිනෙකට වෙනස් මූලාශ්‍ර කිහිපයක් පරිශීලනය කොට තිබූ අතර, ඒ ඔස්සේ හෙළිදරවු කෙරී තිබුණේ මෙම අත්අඩංගුවට ගත් පුද්ගලයින්ගේ බැංකු ගිණුම් වල රුපියල් කෝටි 100 ක මුදලක් ඇති බව කිසිදු නෛතික වාර්තාවක සඳහන් නොවන බවයි. මෙවැනි ප්‍රකාශයක් මාධ්‍යයට තමන් විසින් කිසිසේත්ම ලබානොදුන් බවට හොරොව්පතාන පොලිස් ස්ථානාධිපති රොෂාන් සංජීව මහතාද ප්‍රකාශ කළ බව රැස ලිපිය මගින්ද සඳහන් කරන්නට යෙදිණි.

මෙහිදී ස්ථිරව තහවුරු වූ හෝ නොවූ අනෙකුත් කරුණු කාරණා පසෙකින් තැබුවද, මෙම පුවත්පත් වාර්තාවන් දෙක සසඳා බැලීමේදී පැහැදිලිවම ලංකාදීප ප්‍රවෘත්තියේ නිරවද්‍යතාවය සම්බන්ධයෙන් ගැටළුවක් තිබෙනා බව සනාථ වේ. නිරවද්‍යතාවය රැක ගැනීමට සෑම සියළු සාධාරණ උත්සාහයක්ම ගැනීම මූලිකම ජනමාධ්‍ය ආචාර ධර්මයක් බවද මෙහිදී අපට නැවත වතාවක් සිහිපත් කරදීමට සිදුවේ.

රැස පුවත් වාර්තාව වෙත සබැඳිය: https://bit.ly/2ZpP8lQ